සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

තෙවන වාර පරීක්ෂණය
மூன்றாம் தவணைப் பரீட்சை - 2026
Third Term Test

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 12 | විෂයය / பாடம் / Subject: ලංකා ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper: I | පැය / மணித்தியாலம் / Hours: 3 |

අමතර කියවීමේ කාලය මිනිත්තු 10 කි.
අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත්, පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

**උපදෙස් :**
* මෙම ප්‍රශ්න පත්‍රය **I** හා **II** ලෙස කොටස් දෙකකින් සමන්විත වේ.
* **I කොටසෙහි 1-40** දක්වා ප්‍රශ්න සියල්ලට ම **මෙම පත්‍රයේ ම ලබා දී ඇති උපදෙස් පරිදි** පිළිතුරු සපයන්න.
* **I කොටසෙහි** නිවැරදි පිළිතුරක් සඳහා ලකුණු එක බැගින් හිමි වේ.
* කොටස් දෙකට ම මුළු කාලය පැය තුනකි. පිළිතුරු ලියා අවසන් වූ පසු **I** කොටස, **II** කොටසේ පිළිතුරු පත්‍ර සමඟ අමුණා භාර දෙන්න.

## I කොටස

- අංක 1 සිට 10 තෙක් එක් එක් ප්‍රශ්න සඳහා නම් **පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එකක්** පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ **නොගැළපේ.** එම **නොගැළපෙන** නම කුමක්දැ' යි හඳුනාගෙන එහි **අංකය වරහන තුළ** ලියන්න.

1) 1. ෆාහියන් හිමි 2. අරිස්ටෝටල් 3. චෙංහෝ 4. ඔනෙසික්‍රිටස් 5. කොස්මස් (........)

2) 1. සිල්ප්පදිකාරම් 2. මණිමේකලෛ 3. පදිරිප්පත්තු 4. යාල්පාන වෛපමාලෛ 5. පට්ටිනප්පාලෛ (........)

3) 1. උපෝසථඝර 2. බෝධිඝර 3. ජන්තාඝර 4. ප්‍රතිමාඝර 5. සූතිඝර (........)

4) 1. නර්මදා නදී 2. මහවාලුකා නදී 3. ගෝණ නදි 4. ජජ්ජර නදී 5. කදම්භ නදි (........)

5) 1. මාතොට 2. කසාතොට 3. ඌරා තොට 4. කාලතිත්ථ 5. ගෝකණ්ණතිත්ථ (........)

6) 1. බුන්දල 2. පතිරාජවෙල 3. උඩමලළ 4. පොතාන 5. මිනිහාගල්කන්ද (........)

7) 1. පූලහත්ථ 2. තිරිතර 3. බාහිය 4. පණයමාර 5. පිළියමාර (........)

8) 1. ඵුස්සදේව 2. නන්දිමිත්‍ර 3. දීඝ ජන්තු
4. ථේරපුත්තාභය 5. වේළුසුමන (........)

9) 1. චෝඩගංග 2. නිශ්ශංකමල්ල 3. කල්‍යාණවතී
4. සහාස්සමල්ල 5. ලීලාවතී (........)

10) 1. කලා වැව 2. පදවිය වැව 3. පරාක්‍රම සමුද්‍රය
4. හුරුළු වැව 5. මින්නේරිය වැව (..........)

- අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල **පද යුගල** පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකනෙකට **නොගැළපේ.** එම **නොගැළපෙන** යුගලය කුමක් දැ'යි හඳුනාගෙන ඊට අදාළ අංකය, ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

11) 1. ප්ලිනි - රෝමයට ගිය දූත ගමන පිළිබඳ විස්තර
2. ටොලමි - ලංකාව දැක්වෙන මුල්ම සිතියම
3. මෙගස්තනිස් - මහාවිහාරය පිළිබඳ විස්තර
4. ෆාහියන් - අභයගිරියේ දළදා පෙරහැර පිළිබඳ විස්තර
5. ඉබන් බතුතා - යාපනය රාජධානිය පිළිබඳ විස්තර (..........)

12) 1. පණ්ඩුකාභය රජු - භද්දකච්චායනා දේවිය
2. චෝරනාග රජු - අනුලා දේවිය
3. කාවන්තිස්ස රජු - විහාරමහාදේවිය
4. වට්ටගාමිණී අභය රජු - සෝමා දේවිය (..........)
5. පළමු විජයබාහු රජු - ලීලාවති දේවිය

13) 1. පළමු වරට අනුරාධපුරය අග නගරය කර ගැනීම - පණ්ඩුකාභය රජු
2. පළමු වරට වෛතුල්‍යවාදය පැතිරීම - වෝහාරිකතිස්ස රජු
3. පළමු වරට ඉන්දියාවේ හමුදා සහය පැතීම - පළමුවෙනි මුගලන් රජු
4. පළමු වරට මාඝාතය පැනවීම - ආමණ්ඩගාමිණී අභය රජු
5. පළමු වරට ලම්බකරණ රාජවංශය ආරම්භ කිරීම - වසභ රජු (..........)

14) 1. ධාතුසේන රජු - බුද්ධඝෝෂ හිමි
2. දේවානම්පියතිස්ස රජු - සංඝමිත්තා තෙරණිය
3. මහසෙන් රජු - සංඝමිත්‍ර හිමි
4. මහානාම රජු - ෆාහියන් හිමි (..........)
5. කීර්ති ශ්‍රී මේඝවර්ණ රජු - දන්ත කුමරු

15) 1. විල්පත්තු - වෙරල ආශ්‍රිත විවෘත ජනාවාස
2. බටදොඹලෙන - තෙත් කලාපීය ලෙන්
3. බණ්ඩාරවෙල - කඳුකර එළිමහන් දඩයම් වාසස්ථාන
4. අලිගල - වියළි කලාපීය ලෙන්
5. බුන්දල - තෙත් කලාපීය එළිමහන් ජනාවාස (..........)

- අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් **X** සහ **Y** තීරවලට දී ඇත. **Y** තීරයේ දී ඇති නාම/ ප්‍රකාශන / දින වකවානු **X** තීරයේ දී ඇති ඒවා සමඟ කිසියම් අකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට **නොවේ. Y** තීරය **X** තීරය සමඟ ගැළපෙන අනුපිළිවලට සකස් කළ විට පහත දී ඇති සංයෝග පහෙන් **එකක්** නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් **අංකය** තෝරා **වරහන තුළ** ලියන්න.

16)

| X | Y |
|---|---|
| 1. සේන හා ගුත්තික | A. පස්වන මිහිඳු |
| 2. එළාර | B. අසේල රජු |
| 3. පුළහත්ථ | C. වංකනාසිකතිස්ස |
| 4. කරිකාළ | D. සූරතිස්ස රජු |
| 5. රාජ රාජ | E. වළගම්බා රජු |

I. BDCAE  II. BDECA  III. DBACE  IV. DBCEA  V. DBECA (........)

17)

| X | Y |
|---|---|
| 1. මෙගස්තනිස් | A. චීන |
| 2. හියුත්සාන් | B. ග්‍රීක |
| 3. ප්ලිනි | C. ආරබි |
| 4. ඉබන් බතුතා | D. ඉංග්‍රීසි |
| 5. රොබට් නොක්ස් | E. රෝම |

I. ABCED  II. ABDEC  III. ABECD  IV. BAECD  V. DCBAE (........)

18)

| X | Y |
|---|---|
| 1. තෝනිගල සෙල්ලිපිය | A. ගමක යුක්තිය පිසඳලීම |
| 2. සිතුල්පව්ව සෙල්ලිපිය | B. ධාන්‍ය තැන්පතු ක්‍රමය |
| 3. වේවැල්කැටිය සෙල්ලිපිය | C. විහාර ගමක පාලනය |
| 4. බදුලු ටැම් ලිපිය | D. දස මහා යෝධයන් පිළිබඳව |
| 5. මිහින්තලා පුවරු ලිපිය | E. වෙළඳ පොළක පාලනය |

I. BDAEC  II. BDCAE  III. BDEAC  IV. DBACE  V. DBAEC (........)

19)

| X | Y |
|---|---|
| 1. මින්නේරිය වැව | A. දෙවන මුගලන් |
| 2. කලා වැව | B. පණ්ඩුකාභය |
| 3. අභය වැව | C. වසභ |
| 4. පදවිය වැව | D. ධාතුසේන |
| 5. විලච්චිය වැව | E. මහසෙන් |

I. ADBEC  II. CDBAE  III. DEBAC  IV. EDCAB  V. EDBAC (........)

20) 1. දඹදෙණිය — A. දෙවන බුවනෙකබාහු
2. යාපහුව — B. තුන්වන විජයබාහු
3. කුරුණෑගල — C. හයවන පරාක්‍රමබාහු
4. ගම්පොල — D. පළවෙනි බුවනෙකබාහු
5. කෝට්ටේ — E. හතරවන බුවනෙකබාහු

I. ABDEC II. BDAEC III. BECAD IV. DACBE V. EBDAC (.......)

- අංක 20 සිට 25 තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු **පහ** බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් **එකක් අදාළ මාතෘකාවට නොගැළපේ.** එය තෝරා, ඊට අදාළ **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

21. ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමට ඇති අටුවා ග්‍රන්ථ
    1. විවිධ ග්‍රන්ථවලට කරනු ලබන විස්තර මෙහි ලියා ඇත.
    2. මේවායේ මුල් පිටපත් ලියැවී ඇත්තේ පාලි භාෂාවෙනි.
    3. බුද්ධඝෝෂ හිමියන් විසින් පාලි අටුවා ග්‍රන්ථ රචනා කර ඇත.
    4. සමන්තපාසාදිකාව විනය පිටකයක ලියූ අටුවාවයි.
    5. සිංහල අටුවා ක්‍රමයෙන් විනාශයට පත්වීය.

(.......)

22. ශ්‍රී ලංකාවේ වරායන්
    1. අනුරාධපුර යුගයේ ප්‍රධාන වරාය මහාතිත්තයි.
    2. සංඝමිත්තා තෙරණිය සහ පිරිස දඹකොළ පටුනෙන් ලංකාවට පැමිණියහ.
    3. ත්‍රිකුණාමලය වරායේ පිහිටීම ඉංග්‍රීසින්ගේ අවධානය ශ්‍රී ලංකාවට යොමුවීම කෙරෙහි බලපෑවේය.
    4. ත්‍රිකුණාමලය ලංකාවේ බටහිර වෙරළේ පිහිටා ඇත.
    5. ගෝකණ්ණතිත්ථ පොළොන්නරු යුගයේ ප්‍රධාන වරාය විය. (.......)

23. වසභ රජු
    1. වසභ රජු ලම්බකරණ පෙළපතේ ආරම්භක පාලකයා වේ.
    2. මොහු උමං ජල මාතිකා ක්‍රමය සම්බන්ධයෙන් වැදගත් වේ.
    3. වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කිරීමට දීමනා ලබා දුණි.
    4. මිනිපේ අමුණ වසභ රජුගේ නිර්මාණයකි
    5. මහ වැව් තැනීම ආරම්භ කර ඇත

24. අභයගිරිය
    1. අභයගිරිය වලගම්බා රජු විසින් කරවන ලදී
    2. මෙය ලංකාවේ සුප්‍රසිද්ධ ථේරවාදි මූලස්ථානයක් විය
    3. ෆාහියන් භික්ෂුව අභයගිරියේ නේවාසිකව වැඩ සිටියහ
    4. මෙය කුපික්කල තිස්ස හිමිට පූජා කරන ලදී
    5. ගිරි නිගණ්ඨාරාම සීමාවේ මෙය ඉදිකරන ලදී

(.......)

25. පළමුවන විජයබාහු රජුගෙන් පසු පොළොන්නරුව

1. පළමුවන විජයබාහු රජුගේ මරණින් පසු ඔහු ඇති කළ දේශපාලන එක්සත් බව බිඳ වැටුණි.
2. ඔහුගෙන් පසු වික්‍රමබාහු රජරට රජවිය
3. මානාභරණ දක්ඛිණ දේශයේ පාලකයා විය
4. රුහුණු අටදහස් රට හා දොළොස් දහස් රට ලෙස කොටස් දෙකකට බෙදී තිබුණි.
5. සිරිවල්ලභ අටදහස් රට පාලකයා විය

(.......)

- අංක 26 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති **(A), (B), (C),** සහ **(D)** යන ප්‍රතිචාර හතර අතුරෙන් **එකක් හෝ කිහිපයක් හෝ** නිවැරදි ය. පහත උපදෙස් සම්පිණ්ඩනය අනුව නිවැරදි පිළිතුර තෝරා වරහන තුල ලියන්න.

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| (A) සහ (B) පමණක් නිවැරදිය. | (B) සහ (C) පමණක් නිවැරදිය. | (C) සහ (D) පමණක් නිවැරදිය. | (A) සහ (C) පමණක් නිවැරදිය. | වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් නිවැරදිය |

26. පණ්ඩුකාභය රජු සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය කුමක් ද?

a). ආර්ය අනාර්ය ජනකොටස් අතර සම්මිශ්‍රණයක් ඇති කිරීමට රජු සමත් විය

b). ඔහු මාමාවරුන් දහ දෙනාම මරා රජ විය

c). රාජ්‍යත්වය ලබා ගැනීමට යක්ෂ ගෝත්‍රික දේශීය ජන කණ්ඩායම්වල සහයෝගය ලැබුණි

d). ඔහු චිත්තරාජ සහ කාලවේල යන යක්ෂ ගෝත්‍රිකයන් මරණයට පත් කළේය. (.......)

27. පුරාතන වාරිමාර්ග

a). පෞද්ගලික අයිතිය යටතේද වැව් පැවතුණි

b). වසභ රජුගේ කාලයේදී මහ වැව් තැනීම ආරම්භ කළේය

c). මහසෙන් රජු නුවර වැව ඉදි කළේය

d). මින්නේරිය හා කවුඩුළු වැව් යා කරන ලද්දේ යෝධ ඇළ මගිනි (.......)

28. අනුරාධපුර යුගයේ රාජ්‍ය ආදායම

a). ජල බද්ද බෝජකපති ලෙස හැඳින්වේ

b). රජු ඉඩම්වල හිමිකරුවා ලෙස සැලකූ බැවින් ඉඩම් වලින් බදු අය කර ගත හැකි විය

c). ඉඩම් බද්ද රජුගේ ප්‍රධාන ආදායම් මාර්ගය විය

d). මරාල බද්ද මේ යුගයේ පාලකයන්ගේ රාජ්‍ය ආදායමක් විය (.......)

29. නිශ්ශංකමල්ල රජතුමා

a). නිශ්ශංකමල්ල රජු පාණ්ඩ්‍ය වංශිකයෙක් විය

b). ඔහු බලයට පත් වූයේ පළමුවන පරාක්‍රමබාහු රජුගෙන් පසුවයි

c). ලීලාවතී ඔහුගේ අගමෙහෙසිය විය

d). රජු තුලභාරදාන දීම සිදුකර ඇත (.......)

30. ගම්පොළ රාජධානිය

a). චෝල ආක්‍රමණ මේ යුගයේ බහුලව ඇති විය

b). සේනාධිලංකාර සෙනවිරත් යාපනයේ ආර්ය චක්‍රවර්තීන් පලවා හැරියේය

c). ඉබන් බතුතා නම් අරාබි ජාතික සංචාරකයා ලංකාවට පැමිණියේය

d). නිශ්ශංක අලගක්කෝනාර මෙකල සිටි වැදගත් ඇමතිවරයෙකු විය (.......)

- අංක **31** සිට **35** තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

31. මහින්දාගමනය සම්බන්ධයෙන් තොරතුරු සනාථ වන සෙල්ලිපිය කුමක්ද

1. රජගල සෙල්ලිපි
2. තෝනිගල සෙල්ලිපිය
3. සිතුල්පව්ව සෙල්ලිපිය
4. අනුරාධපුර පුවරු ලිපිය
5. ලබුඇටබැඳිගල සෙල්ලිපිය (.......)

32. කුරුණෑගල යුගයේ ආරම්භක පාලකයා කවුද?

1. පළමුවන බුවනෙකබාහු රජතුමා
2. දෙවන පරාක්‍රමබාහු රජතුමා
3. දෙවන බුවනෙකබාහු රජතුමා
4. හතරවන පරාක්‍රමබාහු රජතුමා
5. හතරවන විජයබාහු රජතුමා (.......)

33. පළමුවන පරාක්‍රමබාහු රජතුමා නගරගිරි කිත්ති සෙනවියා යටතේ ජයග්‍රහණය කරන ලද රට කුමක්ද?

1. සියම් දේශය
3. චෝල දේශය
2. බුරුම දේශය
4. මදුරාපුර දේශය
5. පාණ්ඩය දේශය (.......)

34. අනුරාධපුර යුගයේ දෙවන මෞර්ය රජ පෙළපත ආරම්භ වන්නේ මින් කුමන රජුගේ රජ වීමත් සමඟද?

1. වසභ රජතුමා
3. දෙවන මනාභරණ රජතුමා
2. ධාතුසේන රජතුමා
4. පළමුවන ගජබාහු රජතුමා
5. පණ්ඩුකාභය රජතුමා (.......)

35. පදවිය වැව කරවන ලද්දේ කුමන රජතුමාද?

1. මහසෙන් රජතුමා
3. පළමුවන උපතිස්ස රජතුමා
2. ධාතුසේන රජතුමා
4. දෙවන මුගලන් රජතුමා
5. වසභ රජතුමා (.......)

- අංක 36 සිට 40 තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවේ දැක්වෙන 1,2,3,4 සහ 5 යන කවර ප්‍රකාශ යුගලය දැ' යි තෝරා ඊට අදාළ **අංකය වරහන තුළ** ලියන්න.

| | **පළමුවන ප්‍රකාශය** | **දෙවන ප්‍රකාශය** |
|---|---|---|
| 1 | නිවැරදි ය. | වැරදි ය. |
| 2 | නිවැරදි ය. | නිවැරදි ය. |
| 3 | වැරදි ය. | වැරදි ය. |
| 4 | වැරදි ය. | නිවැරදි ය. |
| 5 | නිවැරදි ය. | නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදා දෙයි. |

| | **පළමු ප්‍රකාශය** | **දෙවන ප්‍රකාශය** | |
|---|---|---|---|
| 36) | සෙල්ලිපිවල අන්තර්ගත වනුයේ සමකාලීන තොරතුරුය. | මේ නිසා සෙල්ලිපි සාහිත්‍ය මූලාශ්‍රවලට වඩා බොහෝදුරට නිවැරදි ලෙස උපකල්පනය කරනු ලබයි. | (.............) |
| 37) | අනුරාධපුරයේ අවසන් පාලකයා වනුයේ පස්වන මහින්ද රජුය | පලමු රාජ රාජ විසින් ආක්‍රමණය කොට අනුරාධපුරය අල්ලාගනු ලබන්නේ හතරවන මිහිදු රජුගේ කාලයේය. | (.............) |
| 38) | ලක්දිව පළමු නිකාය භේදය සිදුවූයේ මහසෙන් රජුගේ කාලයේය. | මහසෙන් රජු ජේතවනාරාමය ඉදිකරවා සංඝමිත්‍ර තෙරුන්ට පූජා කිරීම පළමු නිකාය භේදයට හේතුව විය. | (.............) |
| 39) | චෝලයන් පොළොන්නරුව අගනුවර කර ගෙන එය ජනනාථමංගලම් ලෙස නම් කළේය. | රජරට චෝල රජුගේ ප්‍රාන්තයක් බවට පත්කොට එය මුම්මඩිචෝලමණ්ඩලම් ලෙස නම් කලේය. | (.............) |
| 40) | තුන්වන විජයබාහු රජු දඹදෙණිය අගනුවර කොට මුළු රටම එක්සේසත් කළේය. | ඔහු කොත්මලේ තිබූ දළදා වහන්සේ බෙලිගලට වැඩම කරවීය. | (.............) |